මිනිපේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වත්කම් 06 ක වටිනාකම රු.2,383,566 ක් අඩුවෙන් වත්කම් 3 ක වටිනාකම රු.1,103,514 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ii) | ජල යෝජනා ක්‍රම 05 ක සංවර්ධනය වෙනුවෙන් දරා තිබුණු රු.5,000,910 ක වටිනාකම ප්‍රග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | 2019 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (iii) | හඟුරන්කෙත සභාවෙන් ලැබී තිබූ රු.24,928,660 ක වටිනාකම වූ මෝටර් ග්‍රේඩරය පවරා ගැනීමෙන් තොරව ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |
| (iv) | ස්ථාවර තැන්පත් ගිණුමෙහි ශේෂය රු.383,870 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.141,819,755 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.5,217,479 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීම කළ යුතු වේ. | ඉඩම් ගොඩනැගිලි හා උසාවි දඩ නිවැරදි කරමි. කඩ කුලී ජ'නල් මඟින් ගළපා ඇත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) ලැබිය යුතු ගිණුම් | | |
| වසරක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.9,051,084 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කර්මාන්ත ණයගැති ශේෂය කඩිනමින් ගෙන්වා ගැනීමටද නිවාස කුලී, ජල ගාස්තු, කඩ කුලී, ආදායම් ණයගැතියෝ අයකර ගැනීමට ද දැනුම් දී ඇත. |
| (ii) ගෙවිය යුතු ගිණුම් | | |
| වසරක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ශේෂයන්හි එකතුව රු.4,408,978 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | කර්මාන්ත ණයහිමි හා වියදම් ණයහිමි ශේෂ ගෙවීමට කටයුතු කරමි. අත්තිකාරම් පෙර සිට පැවත එන ශේෂයකි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අයිතිය සනාථ කරන පැවරුම් නියෝග, ලිපිගොනු හා ලේඛන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.124,303,547 ක් වූ ගිණුම් විෂයයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පැවරුම් නියෝග ලැබී නැත. කපා හැරීමට විෂයභාර අමාත්‍යවරයාට යොමුකර ඇත. ලිඛිත සාක්ෂි නැත. පෙර සිට පැවත එන ශේෂයකි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,860,375 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,541,312 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,332,892 | 1,332,892 | 929,810 | 403,082 | 553,942 | 592,883 | 452,890 | 139,993 |
| (ii) | කුලී | 3,280,589 | 3,919,412 | 2,338,827 | 1,580,585 | 3,238,461 | 3,882,678 | 3,258,433 | 624,246 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,510,000 | 2,312,897 | 2,312,897 | - | 2,068,000 | 1,989,272 | 1,989,272 | - |
| (iv) | වෙනත් ආදායම් | 5,624,041 | 32,838,739 | 31,305,060 | 1,533,679 | 6,271,500 | 30,011,618 | 28,465,922 | 1,545,696 |
| | | 12,747,522 | 40,403,940 | 36,886,594 | 3,517,346 | 12,131,903 | 36,476,451 | 34,166,517 | 2,309,935 |

### 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.42,713,875 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.36,886,594 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 86 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | පිළිගනිමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි උසාවි දඩ රු.1,308,583 ක් හා මුද්දර ගාස්තු රු.1,804,500 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 13 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීම කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජල යෝජනා ක්‍රම 03 කින් ජල පාරිභෝගිකයින් 12 දෙනෙකුට පමණක් පහසුකම් සපයා තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු දී නැත. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මොරයාය පුස්තකාලය වටා වැට ඉදිකිරීමේ කර්මාන්තය රු.207,562 ක ප්‍රතිපාදන සලසාගෙන ඇතත්, ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | සැලසුම් කළ ව්‍යාපෘති ඉටු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කරමි. |

(ඈ) පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රියාමාර්ගයක් නොගන්නා අතර, කසළ ව්‍යාපෘතිය ආශ්‍රිතව පරිසරයට හානිවන අයුරින් දහනය කිරීම සිදු කර තිබුණි. | නොදිරන කසළ විධිමත්ව බැහැර කිරීමට කටයුතු කළ යුතු වේ. | හිස් බිම් පිරවීමකට ඉඩමක් නොමැති නිසාත්, දාහකයක් නොමැති නිසාත් පුළුස්සා දමයි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කරගත හැකි පරිදි සංවර්ධන සැලැස්ම සකසමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමස්ථ ජල පාරිභෝගිකයින් 1735 කින් 1422 කට සවිකළ ජල මනු අක්‍රියව පැවතුණි. | ජල මීටර් සවි කිරීමට කටයුතු කළ යුතු වේ. | ෆිල්ටර් සවි කර නොමැති නිසා ජල මීටර් අක්‍රිය වී ඇත. ෆිල්ටර් ටැංකි ඉදිකිරීමෙන් පසු සියලුම ස්ථාන සඳහා ජල මීටර් සවි කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක පුරප්පාඩු හා අතිරික්තතා | | |
| තනතුරු 7 ක පුරප්පාඩු 18 ක් හා එක් තනතුරක අතිරික්තතා 02 ක් පැවතුණි. | සේවක පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සංවර්ධන නිලධාරීන් ලබා දෙන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය සේවා කොමිසමට දැනුම් දී ඇත. අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.4,851,446 ක් පැවතුණි. | ඉඩම පවරා ගෙන කඩ කුලී අයකර ගත යුතු වේ. | පැවරුම් නියෝග මඟින් පවරාගෙන ඇති අතර, හිඟ කුලී සඳහා නඩු දමා ඇත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.1,978,050 ක් වටිනා වාහන 05 ක් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | නිෂ්ක්‍රීය වාහන ඉවත් කිරීම හා ප්‍රයෝජනවත් භාණ්ඩ අලුත්වැඩියා කිරීම. | 2019.01.22 දිනැති මහා සභාව මඟින් වෙන්දේසි කිරීමට තීරණය කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමි. |
| (ආ) | බහුකාර්යය ගොඩනැගිල්ලේ බිම් මහලේ හා දෙවන මහලේ වර්ග අඩි 14000 ක ප්‍රමාණය නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ඇ) | හසලක කොළොංගොඩ තොගපොළේ වූ ගොඩනැගිල්ල හා පැරණි උසාවි ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කිරීම හා තක්සේරු කර බදු දීම කළ යුතු වේ. | වෙළඳුන්ගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි සැකසීමට කටයුතු කරන අතර, උසාවි ගොඩනැගිල්ල ග්‍රාමශක්ති කාර්යාලයක් හා නිල නිවසක් ලෙස සැකසීමට මහා සභාව යෝජනා කර ඇති බව දන්වමි. |
| (ඈ) | රු.848,434 ක් වටිනාකම වූ ජල උපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි. | අවශ්‍යතා හඳුනාගෙන මිලදී ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු දී නැත. |
| (ඉ) | හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවෙන් 2018.05.16 දින ලබාගත් රු.24,928,660 ක් වටිනාකම වූ මෝටර් ග්‍රේඩරය නිෂ්කාර්යව පැවතුණි. | ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | රියදුරු මහතකුගේ අවශ්‍යතාවය පවතින අතර, ඉදිරියේදී ආදායම් ලබා ගැනීමට කටයුතු කරමි. |

3.6 හඳුනාගත් අලාභ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිටපු සභාපතිවරයා අත්තිවාරමක් කඩා ඉවත් කිරීම හේතුවෙන් සිදුවූ රු.24,709 ක අලාභයට පැවති නඩුවෙන් පැමිණිලිකරුට රු.500,000 ක මුදලක් හා ඊට අදාළ නෛතික පොළියක් ගෙවීමට තීන්දු ලබා දී තිබුණි. ප්‍රාදේශීය සභාව මුදල් නොගෙවීම හේතුවෙන්, ප්‍රාදේශීය සභාව සතු රු.1,500,000 ක් වටිනාකම වූ කැබ් රථය හා හසලක නගරයේ අංක 14 දරන කඩ කාමරය අධිකරණයේ භාරයට ගෙන | අලාභ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර ඉදිරි කටයුතු කරමි. |

තිබුණු අතර, නඩුව සමථයකට පත් කරගෙන 2018 ජූලි 26 දින රු.530,500 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. මෙම නඩුව හේතුවෙන් සභාවට සිදුවී ඇති රු.2,030,500 ක අලාභය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

3.7 දෘශ්‍ය අක්‍රමිකතා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු හෙක්ටයාර 0.0487 ක ඉඩමෙහි අනවසරයෙන් පුද්ගලයකු පදිංචි වී තිබුණි. | සභාව සතු ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩමට බලපත්‍රයක් හෝ පැවරුම් නියෝගයක් නොමැති නිසා අයිතිය ලබා ගැනීමට කටයුතු කළද නිරාකරණය කර ගැනීමට නොහැකි වී ඇත. |

3.8 ප්‍රසම්පාදනය

-----------------

කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | 2017 වර්ෂයේ කොලොන්ගොඩ - පලුගොල්ල මාර්ගයේ කොළොංගොඩ විහාරය ළඟ සිට පලුගොල්ල හතරමංහංදිය දක්වා සංවර්ධනය සඳහා රු.16,152,322 කට ගිවිසුම්ගතව රු.16,239,295 කට වැඩ නිමකර තිබුණි. | | |
| (i) | ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 3 අනුව මාර්ගයේ 150 mm ඝනකමට ABC අතුරා තැලීම සඳහා රු.3,125,417 ක් ඇතුළත් කර තිබුණ ද, පරීක්ෂණ වාර්තාව අනුව ABC මිශ්‍රණය ඝනකම ස්ථාන 10 න් 8 ක්ම නියමිත ප්‍රමිතියට නොතිබුණි. | නියමිත ප්‍රමිතියට ඉටුකර ගත යුතු වේ. | පසුව පිළිතුරු සකස් කර එවමි. |
| (ii) | ඇස්තමේන්තු වැඩ විෂයය අංක 04 ප්‍රකාරව මාර්ගයේ (1690 x 3 x 0.05) ප්‍රමාණයෙන් Asphalt ඇතිරීම සඳහා මෙට්‍රික් ටොන් 01 කට රු.13,341.60 බැගින් මෙට්‍රික් ටොන් 595.72 කට රු.7,947,857 ක් ඇතුළත් කර තිබුණද, තාර තට්ටුවේ ඝනකම පිළිබඳ පරීක්ෂණ වාර්තාව අනුව ස්ථාන 10 න් ස්ථාන 3 කම අනුමත ඇස්තමේන්තුවේ ඝනකමට නොතිබුණි. | නියමිත ප්‍රමිතියට ඉටුකර ගත යුතු වේ. | පසුව පිළිතුරු සකස් කර එවමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | පරීක්ෂණ වාර්තා අනුව මෙම මාර්ගයේ පාදම තැලීම පිළිබඳ පරීක්ෂණ ස්ථාන 10 න් 9 ක් නිසි ලෙස ඉටුකර නොතිබුණි. | නියමිත ප්‍රමිතියට ඉටුකර ගත යුතු වේ. | පසුව පිළිතුරු සකස් කර එවමි. |
| (iv) | මෙම මාර්ගයේ මීටර 1700 න් මීටර 600 ක් වූ ගැටළු සහගත නොවන කොටසට බිල්පත් වටිනාකමින් සියයට 35 ක් වූ රු.5,964,534 ක් ගෙවීමට 2018 දෙසැම්බර් 28 දින අනුමැතිය දී ඇතත්, ඉතිරි මීටර් 1100 ට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු හා දුර්වල අධීක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | පසුව පිළිතුරු සකස් කර එවමි. |